**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය - 2021**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාව, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය ක්‍රියාකර ඇති බව,
- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාවිච්චි කිරීමේ හිමිකම මත කාර්යාංශය විසින් 2010 වර්ෂයේදී වර්ෂ 50 ක කාලයක් සඳහා ලබාගෙන තිබූ හෝමාගම පිහිටි ඉඩම සඳහා 2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වාවූ එකතුව රු. 14,174,070 ක ක්ෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 හි 46 ඡේදය පරිදි අතීතානුයෝගීව ගැලපීමට කටයුතු නොකර ප්‍රවර්තන වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව වර්ෂයේ ලාභය ඊට සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී අදාළ පරිදි ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 ඡේදය ප්‍රකාරව වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට ප්‍රත්‍යාගණනයක් කළ යුතු අතර සාධාරණ වටිනාකම් සැලකිය යුතු තරම් ඉක්මණින් වෙනස්වීම් වලින් යුක්ත වන අයිතම සඳහා වාර්ෂික ප්‍රත්‍යාගණනයක් කළ යුතු වුවද කාර්යාංශයේ වත්කම් සම්බන්ධටයන් 2010 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනයක් කර නොතිබීම නිසා දේපළ, පිරියත හා උපකරණ වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන මඟින් නිරූපණය වී නොතිබුණි. | විගණනයෙන් දක්වා ඇති මෙම කරුණ නිවැරදි වේ. වත්කම් ප්‍රත්‍යාගණන කාර්යය බාහිර ආයතනයක් මගින් සිදුකර ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කාර්යාංශය සතු වත්කම්වල නිවැරදි වටිනාකම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විලම්භිත බදු වත්කම් ගිණුමේ ආරම්භක ශේෂය රු.127,248,426 ක් විය යුතු වුවද, එම ශේෂය රු.131,782,817 ක් ලෙස ගිණුම් ගතකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට විලම්භිත බදු වත්කම් ගිණුමෙහි ශේෂය රු.4,534,391 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විගණන විමසුමට අනුව සමාලෝචිත වර්ෂයේ විලම්භිත බදු ගැලපීම ප්‍රවර්තන වර්ෂයේදි (2021) නිවැරදි කරන බවට අප විසින් සඳහන් කර ඇති අතර ඒ අනුව සියළුම නිවැරදි කිරීම් ප්‍රවර්තන වර්ෂයේ අවසන් ශේෂයට ගලපා නිවැරදි කොට ඇත. | පිළිතුර පිළිගත නොහැක. මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පෙර වර්ෂයට අදාල එකතුව රු.2,000,022 ක වියදම් සහ සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස එකතුව රු.22,176,031 ක් වූ ගොඩනැගිලි හා වාහන ක්ෂය සමාලෝචිත වර්ෂයේ වියදමෙන් අඩුකර තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය රු.20,176,009 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ නිවැරදි වේ. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | විගණනය විසින් සිදුකල ගණනය කිරීම් වලට අනුව කාර්යාංශයේ ගොඩනැගිලි සඳහා ප්‍රවර්තන වර්ෂයට අදාල ක්ෂය රු.76,533,717 ක් වුවද, එය රු.77,870,319 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය රු.1,336,602 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | හාලි ඇල, දඹුල්ල, තංගල්ල, රත්නපුර සහ මතුගම ගොඩනැගිලි ක්ෂය ගණනය කිරීමේදී අත්පත් කර ගත් දින සිට වසර 2 ක් දක්වා වාර්ෂිකව නිවැරදිව ක්ෂය ගණනය කර ඇත. නමුත් මෙම ගොඩනැගිලි සඳහා වර්ෂ කිහිපයකට පසු ගොඩනැගිල්ලේ ජීව කාලය (වසර 13 1/3) වැඩි නොවන ලෙස වත්කමේ වටිනාකම වැඩිවීමක් සිදුව ඇත. එම වටිනාකම්ද ඇතුලත්ව ක්ෂය ගණනය කර ඇත. | වර්ෂයට අදාල ක්ෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | විදේශීය රැකියා නියෝජිත ආයතන සඳහා ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම රු.250,487,782 ක් වූ ශේෂයන්ගෙන් විගණනය වෙත ඉදිරිපත්වූ ණයහිමි ශේෂ 40 ක මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම සමඟ සැසඳීමේදී රු.4,096,522 ක් වෙනසක් නිරීක්ෂණය විය. | නියෝජිත ආයතන වල ගිණුම් තැබීමේ නිවැරදිතාවය පිළිබඳව කාර්යාංශයට සහතිකවීමක් සිදු කල නොහැක. කාර්යාංශ ගිණුම් අනුව ණයහිමි ශේෂ වල නිවැරදිතාවය අදාළ ලේඛණ පරික්ෂා කිරීම මඟින් තහවුරු කර ගත හැක. | ශේෂ සනාථන මඟින් ණයහිමි ශේෂ සනාථ කරගත යුතුය. |
| (ඉ) | 2018/2019 හා 2019/2020 තක්සේරු වර්ෂවලට අදාලව ඉදිරිපත් කරන ලද, ආදායම් බදු පිළිබඳව වූ ස්වයං තක්සේරුව සංශෝධනය කිරීම පිළිබඳව වූ අයදුම්පත පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි 136(6) වගන්තිය අනුව දින 90 ක් ඇතුලත දන්වා නොතිබුණු බැවින්, එම | 2018/2019 හා 2019/2020 තක්සේරු වර්ෂ වලට අදාලව සංශෝධිත ආදායම් බදු වාර්තා දේශිය අදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව අප වෙත ලිඛිතව දැනුම්දීමක් මේ දක්වා සිදු කර නොමැති නමුත් වාචිකව ඒ | දේශීය ආදායම් පනතෙහි දක්වා ඇති විධිවිධාන අනුගමනය කළ යුතුය. |

| | |
|---|---|
| පනතෙහි 26(1) උපවගන්තිය අනුව, අයදුම්පත්‍රයට අවසර නොදීමට තීරණයක් ගෙන ඇති ලෙස සැලකිය යුතුය. එහෙත් කාර්යාංශය විසින් 2021/ 2022 වර්ෂයේ ආදායම් බදු ගිණුම් තැබීමේදී ඉහත සංශෝධනයන් පිළිගත් සේ සලකා මූල්‍ය ප්‍රකාශන තුළ බදු ගැලපීම් සිදුකර තිබීම හේතුවෙන් වර්ෂයේ බදු වියදම රු.188,825,244 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සම්බන්ධව තහවුරු කිරීමක් සිදු කර ඇත. |

**1.6 නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත (i) 17 (2) වගන්තිය සහ 45 (2) වගන්තිය | පනතෙහි සඳහන් විධිවිධානයන්ට පටහැනිව කාර්යාංශ අරමුදලට එක්රැස් විය යුතු කාර්යාංශයේ ආදායම් කම්කරු සුභසාධන අරමුදලට එක්රැස් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.544,146,050 ක ආදායමක් එම අරමුදලට බැර කර තිබුණි. | 1985 අංක 21 දරණ කාර්යාංශ පනතේ 45 (2) ඇ යටතේ කාර්යාංශය විසින් සුභ සාධන අරමුදලට මුදල් පැවරීමට හැකියාව ඇති අතර ඒ අනුව විවිධ අවස්ථාවල විවිධ ආකාරයට ලැබී ඇති අනුමැතීන් අනුව මෙම රු.544,146,050 ක මුදල එම අරමුදලට එක්රැස් කර ඇත. | පනත ප්‍රකාරව කම්කරු සුභසාධන අරමුදලට එක්රැස්කළ හැකි ආදායම් පමණක් එම අරමුදලට බැර කළ යුතුය. |
| | (ii) 17 (3) වගන්තිය සහ 48 (1) වගන්තිය | කාර්යාංශ අරමුදලින් ගෙවිය යුතු විදේශ දූත මණ්ඩලවල සේවය සඳහා අනුයුක්ත කරන කාර්යාංශ කාර්ය මණ්ඩලවලට අදාල වැටුප් සහ වෙනත් දීමනා පනතෙහි සඳහන් විධිවිධානයන්ට පටහැනිව එකතුව රු.428,560,316 ක් සමාලෝචිත වර්ෂය තුළදී කම්කරු සුභසාධන අරමුදලෙන් වැය කර තිබුණි. | ශ්‍රී ලංකාවෙන් පිටත සේවයේ නියුක්ති ශ්‍රී ලාංකිකයන්ගේ සුභ සාධන කටයුතු සිදු කිරීමට දූත මණ්ඩල කාර්යය මණ්ඩලය යෙදවීම සහ එයට අදාලව පොදු කාර්යය වියදම් දැරීමට සිදුවේ. අදාළ වියදම් සුබසාධන අරමුදලේ වියදම් ලෙස සැළකීම 1998 ජූනි 03 දිනැති 1998/783/32/017 දරන කැබිනට් නියෝග සහ විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද Accounting circular NO 01 OF 1999 චක්‍රලේඛයට අනුව සිදුකර ඇත. අදාළ චක්‍රලේඛය නිකුත්කර ඇත්තේ මුදල් අමාත්‍යාංශයේ එකගතාවය මත වේ. | දේශීයව අනුයුක්ත කරන කාර්යමණ්ඩලය මෙන්ම විදේශ දූතමණ්ඩලවල පිහිටි සුභසාධන අංශවල සේවය සඳහා යොදවන කාර්යමණ්ඩලයට කාර්යාංශයේ අරමුදෙලන් පහසුකම් සැපයිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛයේ 02 ඡේදයට පටහැනිව 2002 වර්ෂයේ ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත දල වැටුප මෙන් 12 ගුණයක් ආපදා ණය ලෙස ගෙවීමට කාර්යාංශය විසින් කටයුතු කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.84,021,973 ක් නිලධාරීන් 265 දෙනෙකු වෙත චක්‍රලේඛ සීමාව ඉක්මවා ආපදා ණය ලෙස ගෙවා තිබුණි. | පාර්ලිමේන්තුව මඟින් සම්මතකරන ලද කාර්යාංශය පනතේ 16(2) (ඉ), (ඊ) හා උපවගන්ති ප්‍රකාරව ලැබී ඇති බලතල අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කාර්ය මණ්ඩලය වෙත 1995.05.01 දින සිට ආපදා ණය මුදල ලබාදීම සිදු කර ඇත. මෙම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත නිකුත් කර ඇති අතර රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා උපදෙස් නිකුත් කර නොමැත. | ප්‍රධාන ගණන්දීමේ නිළධාරි වෙත චක්‍රලේඛය නිකුත් කර ඇති බැවින් චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ පුවත්පත් 100,000ක් මුද්‍රණය කිරීමට අදාලව පෞද්ගලික ආයතනයක් සමඟ සිදුකල ගනුදෙනුවකදී සිදුවී ඇති රු.3,200,000 ක මූල්‍ය අක්‍රමිකතාවක් සම්බන්ධයෙන්වූ මූලික සහ විධිමත් විනය පරීක්ෂණ වලදී වැරදිකරුවන් බවට තහවුරු වී තිබූ කාර්යාංශයේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් ඉහත කී මුදල වාරික වශයෙන් අයකිරීමට 2019 වර්ෂයේ විනය නියෝග නිකුත් කර තිබුණි. කාර්යාංශය විසින් එම විනය නියෝග ක්‍රියාත්මක නොකර විදේශ දූත මණ්ඩල වලින් ලැබිය යුතු මුදලක් ලෙස සාවද්‍ය ගිණුම් සටහනක් යොදා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ඉන් එක් නිලධාරියකු විසින් ඉදිරිපත් කල අභියාචනයකට අනුව ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත කාර්යාංශ සභාපති විසින් එම නිලධාරීන් නිදොස් කොට නිදහස් කර එම පාඩුව ලැබිය යුතු ආදායම් වලින් ඉවත් කර තිබුණි. | මෙම සිද්ධියට අදාලව කාර්යාංශය විසින් සිදුකර තිබූ විනය පරීක්ෂණ පාදක කරගෙන අදාල පාඩුව වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට 2019 මැයි 24 දින විනය නියෝගයක් නිකුත් කර තිබුණි. එහෙත් ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම් විසින්, 2019 ජුනි 12 පරීක්ෂණ කමිටුවක් පත් කරන ලද බවත්, එකී කමිටුව සඳහා අවශ්‍ය ලේඛණ ලබා දෙන ලෙස කාර්යාංශයට දන්වා ඇත. එකී කමිටුව වෙතින් ලබා ගත් තීරණයට අනුව පෙර කී විනය නියෝගය අවලංගු කර 2021.04.20 දිනැතිව සියළුම චෝදනා වලින් නිදහස් කරමින් සංශෝධිත විනය නියෝගයක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත නැවත නිකුත් කර තිබුණි. එම තීරණය මත සිද්ධියට සම්බන්ධ අනෙක් නිලධාරීන්ද කාර්යාංශයට ඉදිරිපත් | කාර්යාංශයට සිදුවී ඇති පාඩුවට වගකිවයුත්තන් හඳුනාගෙන එම මුදල් නැවත අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කරන ලද අභියාචනය සලකා බලා ඔහුට ලබාදුන් විනය නියෝගයද සංශෝධනය කර සියළුම චෝදනා වලින් නිදහස් කර ඇත. | |
| (ආ) | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්‍යාංශයේ අබුඩාබි හා ඊශ්‍රායල තානාපති කාර්යාලවල පිහිටි කම්කරු සුභසාධන අංශවල පිළිවෙලින් 2014 වර්ෂයේ රු.මිලියන 1.15 ක සහ 2019 වර්ෂයේ රු.මිලියන 1.83 ක මූල්‍ය අක්‍රමිකතා සිදුවී ඇති බව මූල්‍ය ප්‍රකාශනවල සඳහන්ව තිබුණි. ඉන් ඊශ්‍රායල තානාපති කාර්යාලයේ වූ මූල්‍ය අක්‍රමිකතාවයට අදාලව රු.914,167 ක් හා අබුඩාබි තානාපති කාර්යාලයේ සිදුවී තිබූ රු.මිලියන 1.15 ක මූල්‍ය අක්‍රමිකතාවයට අවු. 08 ක් පමණ ගතවී ඇතත් නැවත අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | අබුඩාබි තානාපති කාර්යාලයේ සිදුවී ඇති මුදල් අක්‍රමිකතාවයට අදාලව නීත්‍යානුකූල කටයුතු සිදුවෙමින් පවතී. 2019 වර්ෂයේ ඊශ්‍රායල තානාපති කාර්යාලයේ සිදුවූ මූල්‍ය අක්‍රමිකතාවයට අදාල නිලධාරිනියගෙන් මේ වනවිට රු.1,108,614 කට ආසන්න මුදලක් අයකරගෙන ඇත. ඉතිරි මුදල් අයකරගැනීමේ කටයුතු සිදුකරනු ලබයි. | මූල්‍ය අක්‍රමිකතා හේතුවෙන් සිදු වී ඇති පාඩුව සම්පූර්ණයෙන් ආවරණය කර ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතුය. |

සමාලෝචිත වර්ෂයේ සමූහයේ හා කාර්යාංශයේ මෙහෙයුම් ප්‍රතිඵල පිළිවෙලින් රු.880,154,212 ක සහ රු.895,481,128 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අලාභය පිළිවෙලින් රු.743,764,028 ක සහ රු.736,961,354 ක් විය. .ඒ අනුව සමූහයේ හා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.1,623,918,240 කින් හා රු.1,632,442,482 කින් වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමූහයේ හා කාර්යාංශයේ ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 15 (අ), (ඔ), (ඕ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්ති අවස්ථා නංවාලීම සහ සංවර්ධනය කිරීම, සේවා නියුක්ති අවස්ථා පිළිබඳ පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු කිරීම, සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලාංකිකයන් පිටවීම සහ පෙරළා පැමිණීම සමීක්ෂණය කිරීම සඳහා තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාම අරමුණු කරගෙන පර්යේෂණ අංශය ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂය නිමවන විට නිලධාරීන් 13 දෙනෙකු සේවයේ නියුක්ත කර තිබුණද | මෙහි සඳහන් කර ඇති කරුණ සම්බන්ධයෙන් අදාල පර්යේෂණ වාර්තාවන් 04 ක් ඉදිරි අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ යොමු කරමි. | පනතෙහි අරමුණු ඉටුවන පරිදි පර්යේෂණ සිදුකල යුතු අතර දත්ත බැංකුව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නියැදි පරීක්ෂාවට භාජනය වූ 2020 සහ 2021 වර්ෂවල පර්යේෂණ 09 ක් ආරම්භ කර තිබුණද ඉන් පර්යේෂණ 04 ක වැඩ අවසන් කර තිබුණි. එහෙත් ඉහත අරමුණු ඉටුවන පරිදි එම පර්යේෂණ සිදුකර නොතිබුණු අතර තොරතුරු දත්ත බැංකුවද පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | බදු පදනම මත ලබාගත් හෝමාගම (මාහේනවත්ත) පිහිටි ඉඩම 2015 මාර්තු 23 සිට රු. මිලියන 52 ක තක්සේරු වටිනාකමකට කාර්යාංශයට පවරා ඇති නමුත් විගණන දිනය වූ 2021 දෙසැම්බර් 31 වන විටත් ඊට අදාල බදු ඔප්පුවක් සකසා නොතිබුණි. බදු ඔප්පුව සකස් කිරීම සඳහා නැවත 2018 වර්ෂයේ තක්සේරු කිරීමේදී වටිනාකම රු. මිලියන 64 ක් වී තිබුණි. | හෝමාගම මාහේන වත්ත ඉඩමේ බදු ඔප්පුව සකස් කිරිම සඳහා 2020 මැයි 01 දින නාගරික සංවර්ධන අධිකාරිය වෙත දන්වා යවා ඇති අතර, ඒ සම්බන්ධයෙන් වන ඔප්පු ගාස්තුද 2019 මැයි 06 දින ගෙවා ඇතත් මෙතෙක් ඔප්පුව සකස් කිරිමට අදාලව කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදු කර නොමැත. | බදු ඔප්පුව සකස් කර ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ඇ) | රැකියා බලපත්‍ර ක්‍රමය (Employment Permit System) යටතේ දකුණු කොරියාව වෙත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් යැවීමට අදාලව එරට රජය මැදිහත්ව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමෙහි කාලය 2019 සැප්තැම්බර් 29 දිනෙන් අවසන්වී තිබුණු අතර එම ගිවිසුමට අනුව ගිවිසුම් කාලය අවලංගු වී මාස 06 ක් ඉක්ම යන විටත් සාධාරණ හේතුවකින් තොරව යාවත්කාලීන කිරීම ප්‍රමාද වුවහොත් එම ගිවිසුම අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ හැකියාව පවතී. මේ යටතේ එම රාජ්‍ය වෙත ශ්‍රමිකයින් යොමුකිරීමේ කටයුතු කාර්යාංශය විසින් පමණක් සිදුකළ යුතු අතර පසුගිය වර්ෂ 05 තුල එකතුව 20,144 ක් රැකියා සඳහා යොමුකර තිබුණි. එහෙත් 2020 වර්ෂයේ ආරම්භ කළ ගිවිසුම යාවත්කාලීන කිරීම 2022 ජූලි වනවිටත් නිමවී නොතිබුණි. | සංශෝධන කරන ලද අවබෝධතා ගිවිසුම අමාත්‍යාංශය මගින් කොරියානු පාර්ශවය වෙත මේ වන විටත් ඉදිරිපත් කර ඇත. | රාජ්‍යයන් දෙකක් අතර දැනට ක්‍රියාත්මක හා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට වැඩි වාසි සැලසෙන මෙම රැකියා වැඩසටහනට අදාල ගිවිසුම යාවත්කාලීන කළ යුතුය. |
| (ඈ) | ඊශ්‍රායලය සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් යොමු කිරීමේ අරමුණින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ3) යටතේ සාත්තු සේවක පුහුණු පාඨමාලාව සඳහා කාර්යාංශය විසින් පවත්වනු ලබන නිර්දේශිත නිපුණතා සම්මත විෂය මාලාවට මාස 03 ක් තුල නිමකළ යුතු පාඩම් ඒකක 12 ක් ඇතුලත් වුවත්, කාර්යාංශය එම පුහුණු පාඨමාලාව මාස 02 කින් නිමකිරීමට අනුමැතිය ලබාගෙන තිබුණි. අන්තර්ජාතික නිපුණතා මට්ටම් සඳහා අවශ්‍ය ප්‍රායෝගික පුහුණු පැය 260ක් ආවරණය නොවන පරිදි අනුමැතියකින් තොරව පාඨමාලාවෙහි කාලය දින 45 ක් දක්වාද, නැවත දින 30ක් දක්වාද අඩුකර මාර්ගගත ක්‍රමයට පවත්වා තිබුණි. එම පුහුණුව නිමකර | මීට අදාල අවබෝධතා ගිවිසුම ප්‍රකාරව කාර්යාංශය මගින් සාත්තු සේවකයින් වශයෙන් පුහුණු කිරීමට කටයුතු කර ඇත. ඒ සඳහා වැයවන උපදේශක වැටුප් ගෙවීම සහ අනෙකුත් වියදම්, සඳහා කාර්යාංශ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පුහුණු ගාස්තු වශයෙන් අවම මුදලක් පුහුණුලාභීන්ගෙන් අයකෙරේ. පුහුණු සහතිකය ලබා දී අවුරුද්දකින් පසු නැවතත් දින 07 ක පුහුණුව (refresh) ලබාදෙන ලද්දේ, පෙර ලබා දෙන ලද පුහුණුවේ තත්වයේ ගැටලුවක් නිසා නොවන බව අවධාරණය කරමි. දැනට කාර්යාංශය මඟින් අවබෝධතා ගිවිසුම ප්‍රකාරව දින | කාර්යාංශ පනතට අනුව විදේශ රැකියා සඳහා බඳවාගත් ශ්‍රමිකයින් පුහුණු කිරීම හා හුරු කිරීම ගාස්තු අයකිරීමෙන් තොරව කළ යුතුය. |

| | | |
|---|---|---|
| වසරකට පසුව වීසා අයදුම් කිරීමේදී එම සුදුසුකම් යාවත්කාලීන කිරීමක් අවශ්‍ය බව ඊශ්‍රායල තානාපති කාර්යාලය විසින් දන්වා තිබුණු බැවින් එක් ශ්‍රමිකයෙකුගෙන් රු.8,100 ක් අයකර දින 07 ක් තුල එම විෂය මාලාව නැවත ඉගැන්වීමට කටයුතු කර තිබුණි. රැකියා අවශ්‍යතාවය අනුව ඉංග්‍රීසි භාෂා දැනුම ඇති අය සඳහා ඉංග්‍රීසි මාධ්‍යයන් පුහුණු කර ඔවුන් සඳහා කෙටිකාලීන ඉංග්‍රීසි පාඨමාලාවක් ගාස්තු අයකර පැවැත්වීමටද කාර්යාංශය කටයුතු කර තිබුණි. කාර්යාංශය විසින් විදේශ රැකියා සඳහා යොමුකිරීමේ පදනම මත අයදුම්පත් කැඳවා පුහුණු ගාස්තු ලෙස රු.මිලියන 84.91 ක් අයකර මෙම වෘත්තීය පුහුණු පාඨමාලාව පවත්වා තිබුණද පුහුණුව නිමකළ 5,918 දෙනෙකුගෙන් 862 දෙදෙනෙකු පමණක් අදාල රැකියාව සඳහා විදේශගත වී තිබුණි. | 07 ක පෙර විගමනික පුහුණුවක් නොමිලේ ලබාදෙයි. | |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඊශ්‍රායල රජය සමඟ ශ්‍රී ලංකා රජය ඇතිකරගත් ගිවිසුමකට අනුව සමාලෝචිත වර්ෂයේ සාත්තු සේවකයින් සඳහා රැකියා ඇනවුම් 500 ක් ලැබී තිබුණු අතර 148 දෙනෙකු ඒ සඳහා යොමුකර තිබුණි. ප්‍රායෝගික පුහුණුවක් සහිත මාස 11 ක හෙද පුහුණු පාඨමාලා සහතිකය හෝ කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන NVQ 03 මට්ටමේ සාත්තු සේවක පුහුණු පාඨමාලා සහතිකය ලබා තිබීම මෙම රැකියා සඳහා බඳවාගැනීමේ සුදුසුකම් ලෙස දක්වා තිබුණි. ඒ අනුව තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් ප්‍රායෝගික පුහුණුව සහිත ජාතික වෘත්තීය සුදුසුකම් 04 සහ 03 මට්ටමේ සහතිකය හිමි රාජ්‍ය සහ රාජ්‍ය නොවන පුහුණු මධ්‍යස්ථාන 21 ක විධිමත් පුහුණුවක් නිමකල සිසුන්ට මෙම රැකියාව සඳහා ඉල්ලුම් කිරීමට නොහැකි වී තිබුණි. | විගණන විමසුමේ සඳහන් පරිදි අනෙකුත් ආයතන මඟින් ලබා දෙන සමාන සුදුසුකම් (සාත්තු සේවා III වන මට්ටම) ද ඉහත ගිවිසුමට ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන මෙන් ඊශ්‍රායල් රාජ්‍යය වෙත දැනටමත් ඉල්ලීමක් සිදු කර ඇති බැවින් ඉදිරියේදී එවැනි පුහුණුලාභීන්ටද මේ යටතේ අවස්ථාව උදා වනු ඇත. | ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයින් වෙත ලැබී ඇති මෙම රැකියා අවස්ථාව පිළිබඳව රාජ්‍ය හා රාජ්‍ය නොවන පුහුණු ආයතන දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 මතභේදයට තුඩදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේදී අනුමත බඳවාගැනීමේ පරිපාටියක් නොමැතිව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් මත අයදුම්පත් කැඳවා විදේශ දූත මණ්ඩලවල පිහිටි කම්කරු සුභසාධන අංශ සඳහා කාර්යාංශය විසින් සකස් කරන ලද නිර්ණායක පදනම් කරගෙන සියරට පේරුව පදනමින් 31 දෙනෙකු සහ දේශීය පදනමින් 67 දෙනෙකු බඳවාගෙන තිබුණි. සියරට පදනමින් හා දේශීය පදනමින් තෝරාගැනීමට අදාල සම්මුඛ පරීක්ෂණයේදී සාපේක්ෂව වැඩි ලකුණු ලබාගත් අය සිටියදී පිළිවෙලින් අඩු ලකුණු ලබාගත් 09 දෙනෙකු සහ 16 දෙනෙකු බඳවාගෙන තිබුණි. | 1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ වගන්ති අංක 21 ප්‍රකාරව ගරු විෂය භාර අමාත්‍යාවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දූත මණ්ඩල සේවය සඳහා නිලධාරීන් පත් කල හැකිය. | දූතමණ්ඩල සඳහා නිලධාරීන් පත් කිරීමේදී සුදුසුකම්ලත් නිලධාරීන් බඳවා ගැනීමේ පරිපාටියක් මත සිදුකල යුතුය. |
| (ආ) | සිංගප්පූරුවෙහි පිහිටි විදේශ දූත මණ්ඩලයේ කම්කරු සුභසාධක අංශයේ උපදේශක ලෙස 2020 වර්ෂයේදී බාහිරින් බඳවාගත් නිලධාරියා අදාල තනතුර සඳහා වූ අවම වයස සම්පූර්ණ කර නොතිබුණු අතර අදාල ක්ෂේත්‍රය හෝ එම සේවය පිළිබඳ පළපුරුද්දක් සහිත අයකු නොවූ අතර ඒ සඳහා වූ සම්මුඛ පරීක්ෂණය ස්වාධීන නොවූ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සිදුකර තිබුණි. | මෙම නිලධාරීන් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය යටතේ හා හිටපු අමාත්‍යාංශ ලේකම්තුමාගේ එකඟතාවය මත පත්කර ඇත. තානාපති කාර්යාල සේවය සඳහා පිටත්ව යවන ලබනු අවස්ථාව වන විට ඔහු වයස අවුරුදු 30 සම්පූර්ණ කර තිබේ. මෙම සම්මුඛ පරීක්ෂණ සඳහා අයදුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සහභාගී වන බැවින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල කිහිපයක් පත් කරන ලදි. එහෙත් N.M. තිබ්බුටුමුණුව මහතාගේ පුත්‍රයා සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන දිනයේදී ඒ මහතා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කර නොමැත. | විධිමත් පරිදි සුදුසුකම් හා පළපුරුද්ද ඇති නිලධාරීන් මෙම කාර්යාල සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාංශය සතු නිලධාරීන් 16 දෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකය මඟින් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ විගණන වැඩසටහන් 52 න් වැඩසටහන් 28 ක් වැඩ නිමකර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල | 2021 වර්ෂයේ රටෙහි පැවති අයහපත් තත්වය මත සේවා මුර ක්‍රමය අනුව සේවයට වාර්තා කිරිම හේතුවෙන් සැලසුම් කල විගණන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකිවිය. ඉදිරියේදී ඔබ විසින් පෙන්වා දී ඇති කරුණු වලට අනුව අභ්‍යන්තර විගණන | කාර්යාංශයේ අභ්‍යන්තර පරිපාලන ක්‍රමවේදයට විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක විය යුතුය. |

විගණන වාර්තා 45 ක් නිකුත් කර තිබූ අතර ඉන් 23 කට අදාලව විගණන පැවරුම ලබා දී වාර්තා නිකුත් කිරීමට මාස 06 ත් අවුරුදු 05 ත් අතර කාල ප්‍රමාදයක් වී සිදුවී තිබුණි. එමෙන්ම ඉහත කී වාර්තා 06 ක ඇතුලත් නිරීක්ෂණ සම්බන්ධයෙන් අවශ්‍ය පැහැදිලි කිරීම් අභ්‍යන්තර විගණන ඒකකය වෙත ලැබී නොතිබුණි. අභ්‍යන්තර විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සහ පසු විපරම් කිරීමට විධිමත් වැඩපිළිවෙලක් කාර්යාංශය තුල ස්ථාපිත වී නොතිබුණු අතර විගණන හා කළමනාකරණ කමිටු මඟින්ද ඒ පිළිබඳ ප්‍රමාණවත් සාකච්ඡාවක් සිදුවී නොතිබුණි. ඒ අනුව මෙම ඒකකය වෙත යොමු කර ඇති භෞතික සහ මානව සම්පත් ආයතනයේ අරමුණු කරා, ඵළදායීව උපයෝගීකර ගැනීමට හැකි වැඩ පිළිවෙළක් නොතිබුණු බව නිරීක්ෂණය විය.

වාර්තා වල නිර්දේශ ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව විගණන කළමණාකරන කමිටුවේ අවධානයට යොමු කිරිමට සැලසුම් කර ඇත.